## 2025 ඔක්තෝබර් මාසයට අදාලව 2025.10.21 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2025.10.21
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය** -

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10.ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 17. ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## 01.පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2025.09.23 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2025.10.13 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් වාර්තාව ස්ථිර කරන ලදී.

පසුගිය මහ සභා වාර්තාවේ (2025.09.23 දින) යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 05.01.03 හි බදුකරු විසින් ගෙවියයුතු මුදල රු.666,329.92 ක් වියයුතු බවත් අංක 05.01.06 යෝජනාවෙහි ගෙවියයුතු ඉන්ධන වියදම් රු.2,000,000.00 ක් ලෙස සංශෝධනය වියයුතු බවත් එම සංශෝදනයට

යටත්ව 2025.09.23 දින සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

ගරු මූලාසනය විසින් එම සංශෝධනය පිළිගැනීමට සභාව එකඟ වන්නේදැයි විමසීය.

එම සංශෝධන සහිත වාර්තාව ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධන සහිත වාර්තාවට විරුද්ධත්වයක් ඉදිරිපත් නොවූයෙන් 2025.09.23 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

2025 සැප්තැම්බර් 23 දිනැති මහා සභාවේදී 02.02 නිවේදනය යටතේ ඉදිරිපත් කර ඇති බිබිල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය මඟින් බිබිල සම්පත් මධ්‍යස්ථානය සම්බන්ධයෙන් විරෝධතා ලිපියෙහි දක්වා ඇති "බිබිල ප්‍රාදේශීය සභාවේ වත්මන් සභාපති, උප සභාපති, මන්ත්‍රී මණ්ඩලය ක්‍රියාකර ඇත්තේ මෙම සමාජ තත්වය පිළිබඳ කිසිඳු අවබෝධයක් නොමැතිව බව පෙනේ " යැයි වෘත්තීය පුහුණු ආයතනයේ ස්ථාන භාර නිළධාරි විසින් දක්වා තිබීම හා එම ලිපිය එවීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විරෝධතාවය දක්වන බවත් බිබිල ප්‍රාදේශීය සභාව සතු සම්පත් පරිහරණය කිරීම ඒවා සම්බන්ධයෙන් තීරණ ගැනීම සභාවේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට පූර්ණ අයිතියක් ඇති බවත් එසේ චෝදනා කිරීමට වෘත්තීය පුහුණු ආයතනයේ ස්ථාන භාර නිළධාරිට කළ නොහැකි බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා මේ සම්බන්ධයෙන් පිළිතුරු ලිපියක් යැව්වේ දැයි ගරු මූලාසනයෙන් විමසා සිටින ලදී.

මෙම විරෝධතා ලිපිය ලැබී දින තුනක් ඇතුළත පිළිතුරු ලිපියක් යැවූ බව ගරු මූලාසනය විසින් පවසා සිටි අතර එහි ඡායා පිටපතක්ද මන්ත්‍රී මණ්ඩලය වෙත ලබා දීමට කටයුතු කරන ලදී.

වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය බිබිල ප්‍රාදේශීය සභාවට මාසිකව බදු මුදල් රු.82,000.00ක් ගෙවීමට ප්‍රතිපාදන නොමැති බව දන්වා වෘත්තීය පුහුණු ආයතනයෙහි ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීමට රු.2,600,000.00 ක මුදලක් වැය කිරීමට තීරණය කිරීමෙන් පැහැදිලි වන්නේ සභාව නොමඟ යවා ගොඩනැගිල්ල බදු ලබා ගැනීමට ගත් ප්‍රයත්නයක් බවත් මෙම වෘත්තීය පුහුණු අධිකාරිය විසින් එවන ලද ලිපිය සම්බන්ධයෙන් විරෝධතාවය දක්වන බව ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා ද පවසන ලදී.

බිබිල වෘත්තීය පුහුණු ආයතනය හා වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය සමඟ ගැටීම් ඇති කර ගැනීමක් සිදු නොකර නීත්‍යානුකූලව කටයුතු කිරීම සුදුසු බව මූලාසනය විසින් පෙන්වා දෙන ලදී.

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

### 02.01.ඌව පළාතේ පළාත් පාලන නියෝජිතයින් වෙනුවෙන් සභා රැස්වීම් රීති සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

උක්ත කාරණය සම්බන්ධයෙන් ඌව පළාතේ සියළුම පළාත් පාලන ආයතනවල ගරු මන්ත්‍රීතුමන්ලා සඳහා රැස්වීම් රීති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ඌව පළාත් ගරු

ආණ්ඩුකාරතුමාගේ මඟපෙන්වීම යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර ඇත. මෙම වැඩසටහන සඳහා දිවා ආහාරය හා උදෑසන තේ සඳහා සියලු වියදම් පළාත් පාලන දෙපාර්තමේන්තුව දරණ බවද දන්වා ඇත.

මෙම වැඩසටහන බිබිල ප්‍රාදේශීය සභාවේ හා මැදගම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී මණ්ඩලය සඳහා 2025.10.29 දින බිබිල මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පෙ.ව.9.00 සිට ප.ව.4.00 දක්වා පැවැත්වීමට තීරණය කර ඇත. ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ සියළුම මන්ත්‍රී මණ්ඩලය එදිනට සහභාගි වන ලෙස නිවේදනය කරන ලදි.

## 02.02. ආපදා කළමනාකරණය සම්බන්ධව ප්‍රදේශීය සභා මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් මැදගම හා බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි සිදුවියහැකි ආපදා තත්වයන්ට සාර්ථකව මුහුණදීම සඳහා ආපදා කළමණාකරනය සම්බන්ධව ප්‍රාදේශීය සභා මන්තීවරුන් හා නිළධාරීන් දැනුවත් කිරීමේ වැලසටහනක් 2025.11.07 වන දින පෙ.ව. 9.00 සිට ප.ව.3.30 දක්වා මැදගම ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට දිස්ත්‍රික් කළමනාකරණ ඒකකය මඟින් තීරණය කර ඇත. ඒ සඳහා සියළුම මන්ත්‍රීවරුන් සහභාගි වන ලෙස නිවේදනය කරන ලදි.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

## 03.01.බිබිල බදුල්ලගම්මන දියකොළ අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වියදම් ඇස්තමේන්තු සංශෝදනය කිරීම පිළිබඳවයි.

බිබිල බදුල්ලගම්මන පුබුදු ගොවි සමිතිය මඟින් බදුල්ලගම්මන දියකොළ අතුරු මාර්ගය දිග මීටර් 62ක්ද පළල අඩි 12 ක් වන පරිදි කොන්ක්‍රීට් කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු.977,147.76 ක් වුවද මෙම මාර්ගයෙහි වංගු සහිත ස්ථානය අඩි14ක ප්‍රමාණයට කොන්ක්‍රීට් කර ඉදිකිරීම සඳහා ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී හා ප්‍රාදේශීය සභා තාක්ෂණික නිළධාරිගේ උපදෙස් ලබා දී ඇත.

බලාපොරොත්තු වූ පරිදි සාර්ථකව මෙම මාර්ගය ඉදිකළද මෙම මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා කොන්ක්‍රීට් ඝණ මීටර් 3.5 කට ආසන්න ප්‍රමාණයක් සඳහා වැඩිපුර වැය වී ඇත. ඒ අනුව එහි වියදම රු.110,725.40ක අමතර මුදලක් වැය වී ඇති බැවින් එම මුදල පියවා ගැනීම සඳහා කටයුතු කරන ලෙස ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම පිළිබඳව තාක්ෂණික නිළධාරිගෙන් වාර්තාවක් ලබා ගෙන ඉදිරි සභාවාරයකට ඉදිරිපත් කරන බව ගරු සභාව වෙත නිවේදනය කරන ලදී.

## 03.02. බිබිල ප්‍රාදේශීය සභාව සෑම පුරවැසියෙකුටම සමසේ නොසැලකීම.

බිබිල මහියංගන පාර ඉසුරු උයන පදිංචි ඩී.ඒ.රෝහිණී පීරිස් මහත්මිය බිබිල බෝගහවත්ත පර්චස් 6ක ඉඩමේ ඉදිකිරිමක් සඳහා සැලසුම් අනුමැතිය ලබාගෙන ඇත. මෙම ඉඩමෙහි මායිම මුල් සිතියමේ මල කඳුර දක්වා ඇත. දැනට අධිකරණ නියෝගයක් ලබා ගනිමින් ඉදිකිරීම් තහනම් කර ඇත. ඇය විසින් අධිකරණ නියෝගයට ගරු කරන බවත් එම ඇලෙහි දෙපසින් ඉහලින් හා පහලින් ඉදිකිරීම් සඳහා ප්‍රාදේශීය සභා නිළධාරීන් අවසර ලබා දී ඇති මුත් එම කඳුරේ මැද කොටසේ සිටින සින්නක්කර ඔප්පු සහිත තමා හට පමණක් ඉදිකිරීම් තහනම් කර අසාධාරණයක් සිදුකර ඇති බවත් මේ පිළිබඳව නිරීක්ෂණය කර බලා තමාටද සාධාරණයක් ඉටු කරන ලෙස ඉල්ලුම් කරමින් බිබිල ප්‍රාදේශීය සභාව සෑම පුරවැසියකුටම සමසේ නොසලකා ඇති බවද දන්වා ඇති බව නිවේදනය කරන ලදී.

එම නිවේදනය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම නිවේදනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඩී.ඒ. රෝහිණී පීරිස් මහත්මිය විසින් ඉදිකර ඇති ගොඩනැගිල්ලෙහි අනවසරව ඉදිකර ඇති කොටස කඩා ඉවත් කරන ලෙස අධිකරණ තීන්දුවක් ලබා දී ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස එම මහත්මියට පැහැදිලි කළබව ගරු මූලාසනය විසින් ගරු සභාවට නිවේදනය කරන ලදී.

## 03.03. එල්.ඒ. බංඩුසේන මහතා විසින් අනිවාර්ය ජල ගාස්තු අඩුකරන ලෙස ඉල්ලුම් කිරීම.

බිබිල කවුඩැල්ල ගුරුගේඅරාව පදිංචි එල්.ඒ. බංඩුසේන මහතා විසින් අනිවාර්ය ජල ගාස්තු අඩු කරන ලෙස ඉල්ලීමක් සිදුකර ඇති බව ගරු සභාවට නිවේදනය කරන ලදී.

මෙම මහතා ජලය ලබා ගනු ලබන රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය මෝටරයකින් ක්‍රියාත්මක වන බැවින් අධික විදුලි ගාස්තු පිරිවැයක් සභාවට දැරීමට සිදුවන බැවින් මෙම ජල බිල්පත්හි අනිවාර්ය ගාස්තුව රු.300.00 ක් ලෙස අය කරන බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

මෙම රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය ආදායම් උත්පාදන මාර්ගයක් ලෙසම පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතියක් නොවන බවත් එමඟින් ලැබෙන ආදායමෙන් මෙහි නඩත්තු සිදු කරන බැවින් කිසිසේත්ම ආදායම් උත්පාදනය නොවන බවත් එබැවින් මෙම ස්ථාවර ජල ගාස්තුව අඩු කළහොත් සභා අරමුදලින් මෙම ජල යෝජනා ක්‍රමය නඩත්තු කිරීමට සිදුවන බවත් එසේ වුවහොත් සභාව ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වන බවත් පැවසූ ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා මෙම ජල යෝජනා ක්‍රමයෙන් ස්ථාවර ගාස්තු අඩු කළහොත් අනෙකුත් ජල යෝජනා ක්‍රමවලද ස්ථාවර ගාස්තු අඩුකිරීමට ඉල්ලුම් කරන බවත් ජලය පාරිභෝජනය කිරීම වෙනුවෙන් මහජනයාද මුදල් ගෙවීමට බැඳී සිටිය යුතු බවත් පැවසූ අතර මෙම ස්ථාවර ජල ගාස්තු අඩු නොකරන ලෙසද පැවසීය.

මෙම රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය මුලින්ම පෞද්ගලිකව ආරම්භ කර මෙය නඩත්තු කර පවත්වාගෙන යාමට නොහැකි වූ බැවින් කාලයක් ජලය බෙදා හැරීම නතර කර සිට මෙය පවත්වා ගෙන යාමට බිබිල ප්‍රාදේශීය සභාවට භාරදී ඇති බවත් මේ වන විට අඛණ්ඩව ජලය පාරිභෝගික ජනතාවට ලබා දෙන බැවින් මෙම ස්ථාවර ගාස්තු අඩු නොකරන ලෙස ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා පවසන ලදී.

මේ වන විට මෙම ජල යෝජනා ක්‍රමය මඟින් අඛණ්ඩව ජලය ජනතාව හට බෙදා දෙන බවත් මේ සඳහා ප්‍රාදේශීය සභාව විශාල මුදලක් වැය කරන බැවින් මෙම ස්ථාවර ගාස්තු අඩුකළ නොහැකි බව දන්වා එල්.ඒ.බංඩුසේන මහතා හට ලිපියක් යැවීමට කටයුතු කරන බව ගරු මූලාසනය විසින් දන්වා සිටින ලදී.

## 03.04. පේරගස්පිටිය මාර්ගය පිළිසකර කිරීම සම්බන්ධවයි.

බිබිල 5 කණුව සමාධි බෞද්ධ නිකේතනය අසලින් පිවිසෙන පේරගස්පිටිය මාර්ගයේ සුසාන භූමිය අසළ 1KM පමණ දුර ප්‍රමාණයක් ගමන් කිරීමට නොහැකි ආකාරයටම අබලන් වී ඇති බැවින් එම

කොටස බැකෝ රථයක් යොදවා හෝ පුරවා මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් එම ස්ථානයෙහි තිබූ වීථි ලාම්පුව අක්‍රීය වී ඇති බැවින් එම ස්ථානයට වීථි ලාම්පුවක් යොදා දෙන ලෙසත් අළුතින් තවත් වීථි ලාම්පුවක් ද සවි කර දෙන ලෙසත් පේරගස්පිටිය නිසංසලා කාන්තා සංවිධානය මගින් ඉල්ලීමක් කර ඇති බවත් මෙය සත්‍යක් බවත් එබැවින් මෙම මාර්ගය ප්‍රමුඛ කර ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් හැකි ඉක්මණින් වීථි ලාම්පුව දැමීමට කටයුතු කර දෙන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්. එස්. එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ඉල්ලා සිටින ලදී.

වැගම කොට්ඨාසය භාර ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් මෙම යෝජනාව සංවර්ධන යෝජනාවක් ලෙස ඉදිරිපත් කර ඇති අතර එම මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන(PSDG) සඳහා ඉදිරිපත් කර ඇති බවත් හැකි ඉක්මණින් මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කරන බවත් මෙම මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කළයුතු බවත් ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා පැවසීය.

මෙම මාර්ගය ඉතා කඩිනමින් මෝටර් ග්‍රේඩර් කර ප්‍රතිසංස්කරණය කිරීමට හා අක්‍රීය වී ඇති වීථි ලාම්පු ඉතා ඉක්මණින් සවි කිරීමට හා නව වීථි ලාම්පුවක් ස්ථාපිත කිරීමටද කටයුතු කරන බවත් මූලාසනය විසින් ගරු සභාවට දන්වා සිටින ලදී.

## 04.යථාපරිදි කල්දි ඇති ප්‍රශ්න.

2021 වර්ෂයේ සිට මේ දක්වා අයවැය වාර්තා හා 2025 වර්ෂයේ සිට මේ දක්වා සංවර්ධන යෝජනා හා ඒ සඳහා වැය ඇස්තමේන්තු ගරු මන්ත්‍රී මණ්ඩලය සඳහා ඉදිරිපත් කර ඇත.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා විසින් මෙම කර්මාන්ත ප්‍රගතිය තුළ පිටකුඹුර ප්‍රදේශයේ සංවර්ධනය කළ මාර්ගවල වැය ඇස්තමේන්තු ඇතුළත් වී නොමැති බවයි.

සභා අරමුදලින් සිදුකළ මාර්ග සංවර්ධනය කිරීම් වල වැය ඇස්තමේන්තු ඇතුළත් කර ඇති බවත් රේඛීය අමාත්‍යාංශය මඟින් සංවර්ධනය කළ මාර්ග වල වැය ඇස්තමේන්තු ඇතුළත් කර නොමැති බවත් ගරු මූලාසනය විසින් පෙන්වා දෙන ලදී.

මාර්ග කොන්ක්‍රීට් කිරීමට වඩා කුට්ටි ගල් අල්ලා මාර්ග සංවර්ධනය කිරීමට සුදුසු බවත් කොන්ත්‍රාත්කරුවන් කොන්ක්‍රීට් කිරීමට පෙළඹී ඇත්තේ කුට්ටි ගල් ඇල්ලීමෙන් ඔවුනට ලැබෙන ලාභාංශ අඩු බැවින් බව ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විසින් පවසන ලදී.

කොන්ක්‍රීට් ප්‍රමිතියට මාර්ගවලට යොදා සංවර්ධනය කරනු ලබන්නේ නම් මෙම මාර්ග කැඩී අබලන් නොවන බව ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් පවසන ලදී.

දැනට කුට්ටිගල් සියඹලාණ්ඩුව ප්‍රදේශයෙන් මිලදී ගැනීමට ඇති බවත් ඒවා ප්‍රවාහනය කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවන බවත් කුට්ටිගල් මඟින් කළ හැකි මාර්ග සංවර්ධනයට වඩා වැඩි ප්‍රමාණයක් කොන්ක්‍රීට් ඇතිරීමෙන් කළ හැකි බවත් මූලාසනය විසින් පෙන්වා දෙන ලදී. කුට්ටි ගල් ඇල්ලීම වඩාත් සුදුසු ක්‍රමයක් ලෙස තමාද අදහස් කරන බවත් වැඩි පිරිවැයක් ඒ සඳහා දැරීමට සිදුවන බැවින් කොන්ක්‍රීට් කිරීම සිදුකරන බවත් පැවසූ අතර ඒබීසී යොදා තලා පාර කොන්ක්‍රීට් කරන්නේ නම් එහි පැවැත්ම දීර්ඝකාලීන බවත් පැවසූ ගරු සභාපතිතුමා ඉදිරියේ දී කුට්ටිගල් අල්ලා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරමු යැයි ද පවසනලදි.

## 05.යථාපරිදි කල්දි ඇති යෝජනා.

## 05.01.ගරු මූලාසනයේ යෝජනා.

### 05.01.01. 2026 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධවයි.

2026 වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් සැපයුම් හා සේවා සපයන්නන් ලියාපදිංචි කිරීමටත් ඒ සඳහා එක් විෂයකට රු.500.00ක ලියාපදිංචි ගාස්තුවක් අය කිරීමටත් දැන්වීම් භාෂා ත්‍රිත්වයෙන් පුවත්පත්වල පල කිරීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

විවාද අවස්ථාව අවසන් බව දැන්වූ මූලාසනය විසින් අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 05.01.02. බිබිල ප්‍රාදේශීය සභාව සතු බහු කාර්ය ගොඩනැඟිල්ලේ කඩ කාමර සඳහා තක්සේරු කර එවා ඇති මාසික කුලිය සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු බහුකාර්ය ගොඩනැඟිල්ලේ කඩ කාමර සඳහා අය කළයුතු මාසික කුලී මුදල් සඳහා නව තක්සේරු වාර්තාව තක්සේරු දෙපාර්තමේන්තුවේ MO/RP/500 හා 2025.10.02 දිනැති වාර්තාව මඟින් ලැබී ඇත. 2020.09.22 දිනැති පැරණි තක්සේරු වාර්තාව අනුව 2020 ඔක්තෝබර් මස සිට කුලී අය කිරීම සිදුකර ඇත. පහත දක්වා ඇති 2025.10.02 දිනැති තක්සේරු වාර්තාව අනුව 2025 නොවැම්බර් මස සිට මාසික කුලී පදනම මත ලබා දීමේදී එක් කඩකාමරයක් සඳහා පෙර අයකර ඇති රු.400,000.00ක ආපසු නොගෙවන අතරුදවුම් මුදලට ( Key Money) යටත්ව නව මාසික කුලී මුදල් අය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කඩ කාමර අංකය | දැනට අය කරන කුලී මුදල (2022.09.22 තක්සේරු වාර්තාව) | අයකළ යුතු නව තක්සේරු කුලී මුදල ( 2025.10.02 දිනැති තක්සේරු වාර්තාව) |
|---|---|---|---|
| 01 | 01 | රු. 10,000.00 | රු. 12,500.00 (දොළොස් දහස් පන්සියය) යි |
| 02 | 02 | රු. 6,000.00 | රු. 8,000.00 (අට දහස) යි |
| 03 | 03 | රු. 7,500.00 | රු. 10,000.00 (දහ දහස) යි |
| 04 | 04 | රු. 9,500.00 | රු. 12,000.00 (දොළොස් දහස) යි |
| 05 | 05 | රු. 9,500.00 | රු. 12,000.00 (දොළොස් දහස) යි |
| 06 | 06 | රු. 9,500.00 | රු. 12,000.00 (දොළොස් දහස) යි |
| 07 | 07 | රු. 9,500.00 | රු. 12,000.00 ( දොළොස් දහස) යි |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

විවාද අවස්ථාව අවසන් බව දැන්වූ මූලාසනය විසින් අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.03.2026 පුස්තකාල වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් අනුමත කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල තුනෙහි ඉදිරි ප්‍රවර්ධන කටයුතු සඳහා සෑම වර්ෂයකටම වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් අනුමත කිරීමෙන් පසු පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන් සිදුකරනු ලබන බැවින් බිබිල, කොටගම, නාගල යන මහජන පුස්තකාල තුන සඳහා නිර්ණායක 10කින් යුතු 2026 වාර්ෂික සැලසුම් සකස් කර ඇත. එම වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් අනුමත කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

බිබිල මහජන පුස්තකාලයට පැමිණෙන පාඨකයින්ට නිදහසේ පොත් කියවීම සඳහා දැනට ළමා උද්‍යානයෙන් ගලවා ඉවත් කරන ලද සෙල්ලම් උපකරණ තබා ඇති ස්ථානයෙහි මේස ස්ථාපිත කිරීමට සුදුසු යැයි ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා පවසන ලදී.

බිබිල මහජන පුස්තකාලය දැනට දෙවන ශ්‍රේණියේ පුස්තකාලයක් වන අතර මෙය පළමු ශ්‍රේණියේ පුස්තකාලයක් බවට පත් කිරීමට තවත් පොත් 10,000 ක අඩුවක් හා තවත් පුංචි පුංචි අඩුපාඩුකම් කිහිපයක් පවතින බැවින් පුස්තකාල කටයුතු සඳහා වෙන් කරනු ලබන මුදල වැඩි කිරීමට හා පරිත්‍යාග ලබා ගෙන මෙම පුස්තකාලය පළමු ශ්‍රේණියේ පුස්තකාලයක් බවට පත්කර ගැනීමටත් දැනට මෙම පුස්තකාලය සඳහා සේවක පුරප්පාඩුවක් පවතින බැවින් ඒ පිළිබඳවත් වැඩි අවධානයක් යොමු කරන මෙන් ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු මූලාසනය විසින් අදාළ යෝජනාව සඳහා විවාද අවස්ථාව අවසන් බව දන්වා සිටින ලදී.

### ඌව පළාත් මහජන පුස්තකාල වාර්ෂික සැලස්ම - 2026

---

**සභාව - බිබිල ප්‍රාදේශීය සභාව** **පුස්තකාලය - බිබිල මහජන පුස්තකාලය**

**ඉලක්කගත අරමුණ - 2026 වර්ෂයට අදාලව සැලස්ම සකසා ක්‍රියාත්මක කරීම**

| අංකය | ක්‍රියාත්මක වැඩසටහන /ව්‍යාපෘතිය | වැඩසටහනේ අරමුණ | සිදු කරන ක්‍රියාකාරකම් | කාල රාමුව | ඒක වැඩසටහනට ප්‍රතිපාදන | වැඩසටහන් ගණන | සමස්ථ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | ප්‍රදේශයට හා දිස්ත්‍රික්කයට අදාල විශේෂ වූ තොරතුරු රැස්කිරීම. | දුලබව පවතින ඕනෑම තොරතුරක් අවශ්‍ය වූ සැනින් ඕනෑම පාඨකයකු හට තමාගේ අභිප්‍රාය ඉටුකර ගැනීමට අවකාශ සැලසීම | වෙබ්අඩවි ආශ්‍රිතව සොයා ගැනීමේ සහ ස්ථාන පරික්ෂා කරමින් ලබා ගන්නා තොරතුරු පිලියල කරගැනීම | වර්ෂය පුරාම හැකි ඕනෑම අවස්ථාවක ලැබුණු තොරතුරු එසැනින් ලබා ගැනීම. | රු. 1000 බැගින් පුස්තකාල 3 සඳහා රු.3000.00 | සඳහන් කල නොහැක, අනුමාන වශයේ 10 ක් පමණ | (රු.) 3000.00 |
| 02 | (i) පොත් මිලදී ගැනීම. | තිරසාර සංවර්ධනයෙහිලා දැනුම කුසලතා ආකල්ප තුලින් දැනුමින් පිරි පාඨක සමාජයක් බිහිකිරීම. | පරිත්‍යාග ලැබීම් ලබා ගැනීම, ප්‍රාදේශීය සභාව හරහා පොත් මිලදී ගැනීම | 2026 ඔක්තොම්බර් | (රු.) 500000.00 | 02 | (රු.) 500000.00 |
| | (ii) පොත් රාක්ක සහ ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම. | | පරිත්‍යාග ලැබීම් ලබා ගැනීම, ප්‍රාදේශීය සභාව හරහා රාක්ක මිලදී ගැනීම | | ලිපි ද්‍රව්‍ය 10000.00 පොත් රාක්ක 80000.00 | | 90000.00 |
| | (iii) පුවත්පත් මිලදී ගැනීම. | පුස්තකාල සම්පත් පහසුවෙන් ලබා ගැනීමට හා පරිහරණය කිරීම සඳහා ස්ථාන ලබාදීම ආර්ථික දරිද්‍රතාවයකින් සිටින අය සඳහා පහසුකම් සැලසීම | | | | | |
| | | | පුවත්පත් මිලදී ගැනීම | දෛනිකව | 15000 | 12 | 18000.00 |
| 03 | (i)කතන්දර පැය හා අධ්‍යයන චාරිකා සිදුකිරීම | භාෂාවට සවන්දීම හා ප්‍රයෝගික සුහුරු කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සලසා දීම | ප්‍රායෝගිකව චිත්‍රපට අනුසාරයෙන් හා පොත් පත් ඇසුරෙන් කතන්දර පැය සිදු කිරීම මහජන පුස්තකාලය භාවිතය පිළිබඳව පාසල් ළමුන්ගේ සහභාගිත්ව වැඩි කර ගැනීම | දෛනිකව මාස 03ට සැරයක් | (රු.) 5000.00 | 04 | 20000.00 |
| | පාඨක සමාජ දෙකක් අතර විවාද තරඟයක් සංවිධානය කිරීම | අන්නෝන්‍ය සුහදශීලිභාවය හා අධ්‍යාපනික, සංස්කෘතික සහජීවනය ඉහල නැංවීම | කියවීම් මාසයට අදාලවන තේමාවට අනුව කණ්ඩායම් දෙකක් අතර විවාදයක් පැවැත්වීම. | ඔක්තෝම්බර් මාසය | 50000.00 | 01 | 50000.00 |

**තිරසාර සංවර්ධන උපායමාර්ග -**

| අංකය | ක්‍රියාත්මක වැඩසටහන /ව්‍යාපෘතිය | වැඩසටහනේ අරමුණ | සිදු කරන ක්‍රියාකාරකම් | කාල රාමුව | එක් වැඩසටහනකට ප්‍රතිපාදන | වැඩසටහන් ගණන | සමස්ත මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| 04 | සා.පෙළ /උ.පෙළ සිසුන් සඳහා විභාග පැවැත්වෙන කාල රාමුව අනුව විශේෂිත වූ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම. | අධ්‍යාපනික විෂයානුබද්ධ දනුම පුළුල් කිරීම හා අධ්‍යාපන ඉගෙනුම් ප්‍රවර්ධනය ඉහල නැංවීම පාඨක ප්‍රවර්ධනය ඉහල නැංවීම | ප්‍රයෝගික ක්‍රියාකාරකම් සහිත අධ්‍යාපනික සම්මන්ත්‍රණයක් පැවැත්වීම. | විභාග පැවැත්වෙන කාල සිමාවන් අනුව සිදුකල හැකිය | 50000.00 | 01 | 50000.00 |
| 05 | කියවීම් කඳවුරු පැවැත්වීම | සැඟවුණු කුසලතා හා දක්ෂතා ඔප් නැංවීම තුලින් විනීත නීතිගරුක දරුපරපුරක් බිහිකිරිම. | කියවීම් කඳවුරු සඳහා විශේෂිත වූ විවිධ ක්‍රියාකාරකම් සහිත ප්‍රයෝගික වැඩ සටහන්/ පාඨක සමාජ හෝ දැනුම් සමාජ /පාසල් අතර සිදුකිරීම | ජූනි මාසය තුල | 4000.00 | 02 | 8000.00 |
| 06 | පුස්තකාල ස්වයංක්‍රියකරණය සමග ඉදිරි වැඩසටහන් දියත් කිරීම.<br><br>උපකරණ ලබා ගැනීම හා පවතින ඒවා අළුත් වැඩියා කිරීම. | පාඨක සේවාව වඩාත් කාර්යක්ෂම සේවාවක් බවට පත් කරමින්, පාඨකයා හා කාර්ය මණ්ඩලයේ කාලය සුරකිමින් පුස්තකාල නවීන තාක්ෂනය සමග පාඨකයා සමීප කරමින් ඉහල ගුණාත්මක තත්වයකින් යුතු සේවාවක් ලබා දීම | දැනට ලබාගෙන තිබෙන උපකරන හා මෘදුකාංග උපයෝගී කරගනිමින් ඒවාට නවීන උපකරණ හා නව තාක්ෂණික සේවාවන් මුසු කරමින් සේවාව පුළුල් කරමින් ශාඛා පුස්තකාල සඳහාද තාක්ෂණික සහය ලබා දීම | දෛනිකව වසර පුරාම | 10000.00 | - | 10000.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | මෙහි මුලික අරමුණයි. | හා අප සතු තාක්ෂණික උපකරණ නඩත්තුව කිරිම, අළුත් වැඩියා කිරීම හා අවශ්‍ය නව අංගෝපාංග ඒවාට එකතු කරමින් මෘදුකාංග යාවත්කාලී කටයතු සිදුකරගෙන යාම. | | | | |
| | පුස්තකාල අලවිසැලක් තුලින් පාඨකයන් හට ලැමිනේටින් සේවාව හා මුදිත ස්කෑන් සේවාවක් සැපයීම | පුස්තකාලයට පැමිණෙන පාඨක ප්‍රජාවගේ පහසුකම් වැඩිදියුණු කරමින් සේවාවන් පුළුල්ව ලබා දීම, එමගින් ආයතනය සඳහා අමතර ආදායමක් රැස්කර දීමේ හැකියාවකින් යුක්තවේ. | ලැමිනේටින් උපකරණයක් හා ස්කෑනර් වර්ගයේ උපකරණයක් පුස්තකාලයට මිලදී ගැනීම | වසරේ ඕනෑම කාල සීමාවක | 40000.00 | 1 | 40000.00 |
| අංකය | ක්‍රියාත්මක වැඩසටහන /ව්‍යාපෘතිය | වැඩසටහනේ අරමුණ | සිදු කරන ක්‍රියාකාරකම් | කාල රාමුව | ඒක් වැඩසටහනකට ප්‍රතිපාදන | වැඩසටහන් ගණන | සමස්ත මුදල් ප්‍රමාණය |
| 07 | සමාජ මාධ්‍ය හා වෙබ් සේවා තුලින් පාඨක තොරතුරු සේවා පුළුල් කිරීම. | දැනට පුස්තකාලය සතු සම්පත්තාක්ෂණික සම්පත් උපයෝගී කරගනිමින් සියලුම සමාජ මාධ්‍ය සේවා හා වෙබ් සේවා කටයතු යාවත්කාලින කර තවදුරටත් ඉහල පාඨක සේවාවක් | i)මුහුණු පොත යාවත්කාලින කරීම, ii)වෙබ් අඩවියද යාවත්කාලින කර පාඨක සේවාවන් පුළුල් කිරම. | වසර පුරා | - | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සියළුම දෙනාට ලබා දීම. | Iii) නව යූටියුබ් නාලිකාවක් සැකසීම<br>Iv) වට්ස්ඇප් සේවාව පුළුල් කිරීම | | | | |
| 08 | පුස්තකාල ස්වයංක්‍රිය කරන කටයතු සිදු කිරීම | නව තාක්ෂනය සමගින් පුස්තකාලය බල ගැන්වීම. | දැනට අපගේ ස්වයාක්‍රීය කරන සියළුම සේවාවන් ක්‍රියාත්මක කරමින් පවතී. | වසර පුරා | - | - | - |
| 09 | පාඨක සමාජ හා දැනුම් සමාජ | අන්‍යොන්‍යා සුහදශීලිත්වය වර්ධනය කිරීම. | පාඨක සේවා පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන් යාවත්කාලින කිරීම තුලින් පාඨක ප්‍රවර්ධනය ඉහල අගයකට ගෙන ඒම. | නොවැම්බර් මාසය | 5000.00 | | 5000.00 |
| | උපදේශන කමිටු ක්‍රියාත්මක කිරීම | පුස්තකාල ප්‍රවර්ධනය සඳහා විශේෂ උපදෙස් හා කරුණු, තීරණ, යෝජනා සම්මත කර ගැනීම හා ක්‍රියාත්මක කර ගැනීම. | මාස 03 ට වරක් හෝ විශේෂ අවස්ථාවන්හිදී ඒකරාශීවී සාක්ච්ජා කිරීම. | මාස 03 ට වරක්<br>( වසරකට 4 වතාවක්) | 5000.00 | 4 | 20000.00 |
| 10 | වෙනත් ව්‍යාපෘති -:<br>පුස්තකාලයේ බාහිර කියවීම් ශාලා පහසුකම් සැකසීම. | නිදහස් අධ්‍යන කටයතු සිදුකිරීම හා නිදහස් ස්වයං අධ්‍යන කටයුතු තුලට පාඨකයා යොමු කිරිම. | ආයතනයේ බාහිරින් ඇති ඉඩ පුස්තකාලය තුල විවිධාකාර වූ තැන් ස්ථාපිත කරමින් නිදහස් කියවීම් ශාලාවක් සැකසීම. | ජනවාරි මාසය | 30000.00 | 1 | 30000.00 |

| | |
|---|---|
| | **මුළු එකතුව** රු. **844000.00 /=** |

## පළාත් මහජන පුස්තකාල වාර්ෂික සැලස්ම - 2026

**සභාව - බිබිල ප්‍රාදේශීය සභාව** **පුස්තකාලය - කොටගම මහජන පුස්තකාලය**

**ඉලක්කගත අරමුණ - 2026 වර්ෂයට අදාලව සැලස්ම සකසා ක්‍රියාත්මක කරීම**

**තිරසර සංවර්ධන උපායමාර්ග -**

| අංකය | ක්‍රියාත්මක වැඩසටහන /ව්‍යාපෘතිය | වැඩසටහනේ අරමුණ | සිදු කරන ක්‍රියාකාරකම් | කාල රාමුව | එක් වැඩසටහනකට ප්‍රතිපාදන | වැඩසටහන් ගණන | සමස්ත මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| 01 | ප්‍රදේශයේ අවශ්‍ය වන සියළු තොරතුරු ඇතුළත් කර සකස් කළ වාර්තාවේ තොරතුරු යාවත්කාලීන කිරීම. | ග්‍රාමීය පළාතේ හා ගෝලීය වශයෙන් වටිනා තොරතුරු සේවා සංවිධානය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සහ සමෘද්ධිසංවර්ධන නිළධාරිතුමා ,සංවර්ධන නිළධාරිතුමා, කෘ.ප.නි.ස. මහතා වැනි පුද්ගලයින්ගෙන් විස්තර ලබා ගැනීම | ජනවාරි | 1000.00 | 01 | (රු.) 1000.00 |
| 02 | (i) පොත් මිලදී ගැනීම. | මුද්‍රිත හා මුද්‍රිත නොවන කියවීම් ද්‍රව්‍ය හා උපකරණ සුලභ කිරීම | • පරිත්‍යාග පොත් ලබා ගැනීමට කටයුතු කිරීම<br>• බිබිල ප්‍රාදේශීය සභා අරමුදල් මඟින් පොත් මිලදී ගැනීමට කටයුතු කිරීම | වසර පුරා<br><br>සැප්තැම්බර් | (රු.) 100000.00 | | (රු.) 100000.00 |
| | (ii) පුවත්පත් හා සඟරා මිලදී ගැනීම. | | | වසර පුරා | | | 80000.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 03 | (i)කතන්දර පැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | මානව පුස්තකාල හා සාහිත්‍ය රසස්වාද වැඩසටහන් පවත්වාගෙන යාම | කොටගම ශ්‍රී දේවී පෙර පාසලේ දරුවන් සහ කොටගම ප්‍රාථමික විදුහලේ දරුවන් සම්බන්ධ කර ගනිමින් මාස තුනකට වරක් පැවැත්වීම. | මාස තුනකට වරක් | (රු.) 5000.00 | 04 | 20000.00 |
| 04 | ප්‍රදාන පුස්තකාල හා එක්ව දරුවන් සඳහා විශේෂ සම්මන්ත්‍රණ පැවැත්වීම. | පාඨක ප්‍රවර්ධනය | අ.පො.ස. උසස් පෙළ ළමුන් සඳහා විශේෂ සම්මන්ත්‍රණයක් පැවැත්වීම. | අගෝස්තු | 25000.00 | 01 | 25000.00 |
| 05 | E – learning අංශය මඟින් පවත්වනු ලබන අධ්‍යාපනික වැඩසටහන් තවදුරටත් පුළුල් කිරීම. | ප්‍රදේශයේ දුවා දරුවන්ගේ අධ්‍යාපනික මට්ටම ඉහළ නැංවීම. | පුස්තකාලයේ ඇති බහුවිධ රූපවාහිනී යන්ත්‍රය භාවිතයෙන් ප්‍රධාන වශයෙන් DP Education youtube නාලිකාවේ ඇති පාඩම් මාලා කාල සටහනකට අනුව විකාශය කිරීම. | දිනපතා | - | - | 10000.00 |
| 06 | පුස්තකාල තොරතුරු ක්‍රමානුකූලව පරසණකගත කිරීම | නවීන තොරතුරු සන්නිවේදන හා ඩිජිටල් පුස්තකාල ප්‍රවේශ සඳහා යොමු වීම | පුස්තකාල පරිග්‍රහණ ලේඛනය,භාණ්ඩ ලේඛනය ආදිය පරිසණක ගත කිරීම. | දෛනිකව | - | - | - |
| 07 | වෙබ් අඩවියක් නිර්මාණය කිරීම | වෙබ් අඩවි හා සමාජ වෙබ් අඩවි තුළින් පාඨක තොරතුරු සේවා පුළුල් කිරීම | • Whatsapp, face book වැනි සමාජ මාධ්‍ය මගින් ලබා දෙන තොරතුරු පුළුල් කිරීම<br>• වෙබ් අඩවි නිර්මාණය කිරීම | මාර්තු | 2000.00 | - | 2000.00 |
| 08 | ප්‍රධාන පුස්තකාලයෙන් හා පුස්තකාල ස්වයංක්‍රීයකරණ සේවා පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීම | පුස්තකාල ස්වයංක්‍රීය කටයුතු සඳහා යොමු වීම | ප්‍රධාන පුස්තකාලයේ කාර්ය මණ්ඩලය මඟින් අවශ්‍ය පුහුණුව ලබා ගැනීම | මසකට වරක් | - | - | - |
| 09 | • පාඨක සමාජ පිහිටුවීම<br>• උපදේශන කමිටුව රැස්වීම | • පුස්තකාල කටයුතු ක්‍රමවත් කිරීම<br>• ගැටලු නිරාකරණය කිරීම | පුස්තකාල පාඨක සමාජය සහ උපදේශන කමිටු කැඳවීම සහ නිළධාරි මණ්ඩලය පත් කිරීම | මාස තුනකට වරක් | - | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | • පාඨකයින් දැනුවත් කිරීම | | | | | |
| 10 | • ගැහැණු හා පිරිමි දෙපාර්ශවයටම ඇත්තේ එක් වැසිකිලියක් බැවින් තවත් වැසිකිලියක් ඉදිකිරීම.<br>• පුස්තකාල ගෙමිදුල කුට්ටිගල් අල්ලා ක්‍රමවත් කිරීම<br>• හරිත පුස්තකාල සංකල්පය | විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් පුස්තකාලය ක්‍රමවත් කිරීම | • තවත් වැසිකිලියක් ස්ථාපිත කිරීම<br>• ගෙමිදුල අලංකාර කිරීම<br>• පැල සිටුවීමේ සහ ශ්‍රමදාන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම | ජූලි | 500000.00<br><br>30000.00 | | 53000.00 |
| එකතුව | | | | | | | **768000.00** |

## ඌව පළාත් මහජන පුස්තකාල වාර්ෂික සැලස්ම - 2026

**සභාව - බිබිල ප්‍රාදේශීය සභාව** **පුස්තකාලය - නාගල මහජන පුස්තකාලය**

**ඉලක්කගත අරමුණ - 2026 වර්ෂයට අදාලව සැලස්ම සකසා ක්‍රියාත්මක කිරීම**

**තිරසාර සංවර්ධන උපායමාර්ග -**

| අංකය | ක්‍රියාත්මක වැඩසටහන /ව්‍යාපෘතිය | වැඩසටහනේ අරමුණ | සිදු කරන ක්‍රියාකාරකම් | කාල රාමුව | එක් වැඩසටහනකට ප්‍රතිපාදන | වැඩසටහන් ගණන | සමස්ත මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| 01. | ඌව පළාතේ සංචාරක ස්ථාන පිලිබඳව තොරතුරු එක්රැස් කිරීම. | පළාතේ සංචාරක ස්ථාන පිලිබඳව දැනුවත් කිරීම. | පුවත්පත් සහ වෙබ් අඩවි භාවිතයෙන් තොරතුරු ගොනුගත කර ගැනීම. | ජනවාරි | 1000.00 | 01 | 1000.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 02. i | පොත් මිලදී ගැනීම. | පාඨක ප්‍රවර්ධනය | ප්‍රාදේශීය සභා අරමුදලින් සහ පොත් පරිත්‍යාග ලැබීම. | ඔක්තෝම්බර් | 100,000.00 | 01 | 100,000.00 |
| i i | පුවත්පත් සහ සඟරා මිලදී ගැනීම. | මුද්‍රිත කියවීම් සුලභ කිරීම | එදිනෙදා සිදුවන දේශපාලන,ආර්ථික, සාමාජික,ආගමික තොරතුරු දැනගැනීම | වසර පුරා | 80, 000.00 | 01 | 80, 000.00 |
| i i i | ළමා අංශයේ දරුවන්ගේ ක්‍රියාකාරකම් සඳහා භාණ්ඩ මිලදී ගැනීම.(වෙස්බෝඩ් /දාම්බෝඩ් /බිල්ඩින් බොක්ස්) | කියවීම් ද්‍රව්‍යය සහ උපකරණ සුලභ කිරීම. | දරුවන්ගේ හසුරු කුසලතා සහ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම. | ඔක්තෝම්බර් | 10, 000.00 | 01 | 10, 000.00 |
| 03. i | කතන්දර පැය වැඩසටහන් පැවැත්වීම. | මානව පුස්තකාල රසාස්වාද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | භාෂා කුසලතා /කථන/ සවන්දීමේ හැකියාව ඔප් නැංවීම. | මාස 03 වරක් | 3750. 00 | 04 | 15, 000 .00 |
| i i | සාහිත්‍යය රසාස්වාද වැඩසටහන් පැවැත්වීම.(නාට්‍යය/ චිත්‍ර/ගායන/නර්තන) | සාහිත්‍යය රසාස්වාද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | පාඨකයින්ගේ දක්ෂතා සහ හැකියාවන් වර්ධනය කිරීම. | සැප්තැම්බර් | 15,000. 00 | 01 | 15, 000 .00 |
| 04. | ප්‍රධාන පුස්තකාලය හා ඒකාබද්ධව සම්මන්ත්‍රණ පැවැත්වීම. | පුස්තකාල පාඨකයින්ගේ ප්‍රවර්ධනය සඳහා මෙන්ම දරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම. | සාමාන්‍යපෙළ හෝ උසස්පෙළ සිසුන්ගේ දැනුම වඩා වර්ධනය කිරීම සහ ඉගෙනුම් කෙටි ක්‍රම ශිල්ප භාවිතය පිලිබඳව දැනුවත් කිරීම. | විභාග පැවැත්වෙන දින/මාස අනුව | - | 01 | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 05. i<br><br>i i | පාඨක අධ්‍යාපනික වැඩසටහන් පවත්වාගෙන යාම.<br><br>කියවීම් කඳවුරක් පැවැත්වීම. | අධ්‍යාපනික හා අවබෝධාත්මක වැඩසටහන් පවත්වාගෙන යාම.<br><br>අධ්‍යාපනික හා අවබෝධාත්මක වැඩසටහන් පැවැත්වීම. | පාඨකයින්ගේ දැනුම සහජ හැකියාවන් වැඩිදියුණු කිරීම.<br><br>දරුවන්ගේ කියවීම් රුචිය වැඩිදියුණු කිරීම. | මාස 03 වරක්<br><br>මාර්තු | 1750.00<br><br>5000.00 | 04<br><br>01 | 7000.00<br><br>5000.00 |
| 06. | පුස්තකාල තොරතුරු පරිගණකගත කිරීම. | නවීන තාක්ෂණික උපකරණ භාවිතයෙන් පුස්තකාලයේ දත්ත එක්රැස් කිරීම. | පුස්තකාලයෙහි ඇති ලිපි ලේඛන ද්‍රව්‍ය/පරිග්‍රහණ ලේඛණය ආදිය ගොනු ගත කිරීම. | දෛනිකව | - | 01 | - |
| 07. | ෆේස්බුක් ගිණුමක් ආරම්භ කිරීම. | පුස්තකාලය පිළිබඳව තොරතුරු දැනගැනීම. | වෙබ් අඩවි තුලින් පාඨක තොරතුරු හා සේවා පුළුල් කිරීම. | මසකට වරක් | - | - | - |
| 08. | ප්‍රධාන පුස්තකාලය හා ඒකාබද්ධව පුස්තකාල ස්වයංක්‍රියකරණ සේවා පිළිබඳව ප්‍රයෝගික පුහුණුව ලබාගැනීම. | පුස්තකාල ස්වයංක්‍රියකරණ කටයුතු සඳහා යොමුවීම. | ස්වයංක්‍රියකරණය පිළිබඳව දැනුම ලබාගැනීම. | මසකට වරක් | - | - | - |
| 09. | Whats app,Face book,Zoom තාක්ෂණය මගින් උපදේශක කමිටු රැස්කිරීම සහ දැනුවත් කිරීම. | පුස්තකාලයේ උන්නතිය කටයුතු කිරීම. | පාඨක සමාජ පිහිටුවීම සහ පාඨක ප්‍රවර්ධනය. | මාස 3 වරක් | 750.00 | 04 | 3000.00 |
| 10. | නිර්මාණ කුසලතා එළිදැක්වීමට ළමා අංශය සඳහා කැටපත් පවුරක් නිර්මාණය කිරීම. | දරුවන්ගේ නිර්මාණාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීම. | පාඨකයින් දැනුවත්කර ඔවුන්ගේ හැකියාවන් ඔප්නැංවීමට කටවුතු කිරීම. | අගෝස්තු | 10.000 00 | 01 | 10.000 00 |
| | **එකතුව** | | | | | | **246,000.00** |

විවාද අවස්ථාව අවසන්වීමෙන් පසු අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීය.
එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.04.බිබිල බස් නැවතුම්පොලට යාබදව ඇති කඩකාමර සම්බන්ධවයි.

බිබිල බස් නැවතුම්පොළට යාබදව වම්පස ඉදිකර ඇති වෙළඳකුටි තාවකාලික බඳු ගිවිසුමක් යටතේ 2022 වර්ෂයේ බඳු දී තිබේ. 2023 වර්ෂයේදී මෙම තාවකාලික බඳු ගිවිසුම අවලංගු කර ඇත. එසේම මෙහි ඇතැම් බඳුකරුවන් එම කඩකාමර අතුරු බඳු දී තිබෙන බවද ආදායම් පරීක්ෂක කළ නිරීක්ෂණයේදී හෙලි දරව් වී ඇත.

මෙම ඉදිකිරීම් අනවසරයෙන් ඉදිකර ඇති බැවින් කඩ ඉවත් කර ගන්නා ලෙස දන්වා යැවුවද මේවන තෙක් ඉවත් කරගෙන නොමැත.

මේ සම්බන්ධව ඌව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක 12/4/2/5 හා 2025.09.03 දිනැති ලිපිය මඟින් මෙම අනවසර ඉදිකිරීම් පිළිබඳව සුදුසු කටයුතු කිරීමටද, අදාල කඩ හිමියන්ගේ ඉල්ලීම පිළිබඳ සලකා බලා වෙනත් විකල්ප ස්ථාන ලබාදීම හෝ සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මහ සභා තීරණයක් ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට සුදුසු බව දන්වා ඇත. එබැවින් එම කඩ කාමර පිළිබඳව තීරණයක් ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල බස් නැවතුම්පොළට යාබදව වම්පස ඇති කඩ කාමර ඉවත් කර පොලිස් මුරකුටියක් ස්ථාපිත කිරීමට සුදුසු නොමැති බවත් බස්නැවතුම්පොලෙහි උඩු මහලෙහි විවිධ විෂමාචාර ක්‍රියා සිදුවන ස්ථානයක් බැවින් එම කොරිඩෝවෙහි විවෘත ස්ථානයක පොලිස් මුරකුටිය ස්ථාපිත කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා පෙන්වා දෙන ලදී.

ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් පවසා සිටියේ පොලිස් නිළධාරීන් උඩු මහලෙහි සිටීමට අකමැති බවත් එබැවින් මෙම බස් නැවතුම්පොලට යාබදව වම්පස ඇති කඩ කාමර ඉවත් කර එම ස්ථානයෙහි පොලිස් මුරකුටිය ස්ථාපිත කිරීම සුදුසු බවත් එමඟින් නගරයේ ආරක්ෂාව වැඩි වන බවත්ය. නගරයේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට මෙය මහඟු අවස්ථාවක් බවත් පැවසීය.

විවාද අවස්ථාව අවසන් බව දැන්වූ මූලාසනය විසින් අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.05. එච්.එම්. බණ්ඩාර හේරත් මයාගේ ඉඩමේ ප්‍රවේශකත්වය සම්බන්ධවයි.

බිබිල බස්නැවතුම්පොල පිටුපස අරාවවත්ත ඉඩමෙහි පදිංචි එච්.එම්. බණ්ඩාර හේරත් මයා විසින් MO112265 දරන මිනින්දෝරු සැලැස්ම අනුමැතිය සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

එහිදී අදාළ භූමියට ප්‍රවේශකත්වය ලබාගන්නේ බිබිල බස්නැවතුම්පොල පරිශ්‍රයෙන් බැවින් ඒ සඳහා පරවශ්‍යතා අයිතිය බිබිල බස්නැවතුම්පොල ඉඩම හිමි ආයතනයෙන් ලිඛිතව ලබාගෙන ඉදිරිපත් කරන ලෙස දන්වා යවන ලදී.

නමුත් එච්.එම්. බණ්ඩාර මයා 2025.09.11 දිනැති ලිපිය මගින් මෙම වාගොල්ල අරාව යන ඉඩමට ප්‍රවේශ මාර්ගය වසර ගණනාවක සිට පාරම්පරිකව භුක්ති විදින බව දන්වා සිටින අතර එම නිසා මේ සම්බන්ධව නීත්‍යානුකූල අවසරය ලබා දෙන ලෙස ඉල්ලා සිටියි. මේ පිළිබඳව සුදුසු තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එච්.එම්. බණ්ඩාර හේරත් මයාගේ ඉඩමට ප්‍රවේශ මාර්ගය පිහිටා ඇත්තේ ප්‍රවාහන අධිකාරිය සතු ඉඩමක බැවින් බිබිල ප්‍රාදේශීය සභාවට මෙම මාර්ගයට නීත්‍යානුකූල අයිතිය ලබාදීමට නොහැකි නමුත් මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගයක් අවශ්‍ය බවත් එම මහතා අධිකරණමය ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වුවහොත් එතුමාගේ මානව අයිතිවාසිකමක් ලෙස ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීමට හැකි වෙතැයි ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

මෙම බිබිල බස් නැවතුම්පොල වාගොල්ලවත්ත සින්නක්කර ඉඩමකින් ලබාගෙන ඇති අතර 1965 දී පමණ මෙම ඉඩම ප්‍රවාහන අධිකාරිය වෙත පවරාගෙන ඇති බවත් මෙම එච්.එම් බණ්ඩාර මහතාගේ නිවසට යැමට මාර්ගයක් අවශ්‍ය බවත් ගරු ඩබ්.එම්.රූපසේන මැතිතුමා පෙන්වා දුන් අතර බිබිල ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූල අවසරයක් මෙම මාර්ගයට ලබාදීමට නොහැකි බවත් එච්.එම්. බණ්ඩාර හේරත් මහතා හට පිවිසුම් මාර්ගය ලබාදීම සුදුසු බව ප්‍රවාහන අධිකාරිය වෙත දන්වා යැවීම සුදුසු බව පැවසීය.

මීට පෙර මෙම බස් නැවතුම්පොල දැනට පවතින පොල භූමියෙහි තිබූ බවත් 1971 දී මෙම බස් නැවතුම්පොල වාගොල්ලවත්ත සින්නක්කර ඉඩමක පිහිට වූ බවත් එබැවින් මෙම එච්.එම්. බණ්ඩාර මහතාගේ ඉඩමට ප්‍රවේශ මාර්ග ලබාදියයුතු බවත් බිබිල ප්‍රාදේශීය සභාවට මෙම ප්‍රවේශ මාර්ගය නීත්‍යානුකූලව ලබා දිය නොහැකි බැවින් ප්‍රවාහන අධිකාරියට මෙම මාර්ගය එච්.එම්. බණ්ඩාර හේරත් මහතාට ලබාදීම සුදුසු බව දැන්වීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා පැවසීය.

බිබිල බස් නැවතුම්පොල පිටුපස පිහිටි එච්.එම්.බණ්ඩාර මයාගේ ඉඩමට ප්‍රවේශ මාර්ගය පිහිටා ඇත්තේ ප්‍රවාහන අධිකාරියට අයත් බිබිල බස්නැවතුම්පොල ඉඩමෙන් බැවින් බිබිල ප්‍රාදේශීය සභාවට මේ සඳහා

නීත්‍යානුකූල අවසරයක් ලබාදීමට නොහැකි බැවින් පාරම්පරිකව වසර ගණනාවක් භාවිතා කළ මෙම මාර්ගයට නීත්‍යානුකූල අවසරයක් ලබාදීමට සුදුසු බවත් මාර්ගය ලබාදීමට අවශ්‍ය කටයුතු සලසන ලෙස ප්‍රවාහන අධිකාරියට දන්වා යැවීමට තීරණය කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව දැන්වූ මූලාසනය විසින් අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

## 05.01.06. කින්දගල්ල ගම්මානයට පිවිසෙන ස්ථානයේ මාර්ගය ගිලා බැසීම සම්බන්ධවයි.

බිබිල කොකුන්නෑව ග්‍රාම නිළධාරි වසමට අයත් කින්දගල්ල බලගොල්ල මාර්ගයේ ආරම්භක ස්ථානය ගිලා බැසීමට ලක්වන බවත් එය වලක්වා ගැනීම සඳහා පැති බැම්මක් සකස් කර දෙන ලෙසත් ගම්වාසීන් විසින් ඉල්ලුම් කර ඇති බැවින් එම මාර්ගය ආරක්ෂා කර ගැනීම සඳහා පැති බැම්මක් සකස් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අම්පාර ප්‍රධාන මාර්ගයෙන් කින්දගල්ල ගම්මානයට පිවිසෙන ස්ථානය ගල් අතුරා සකස් කර ඇතත් මෙම මාර්ගය ගිලා බැස ඇත. මෙම වර්ෂා සමයෙහි මෙය ගිලා බැසහොත් ගමනාගමනය සම්පූර්ණයෙන්ම අඩාල වන බවත් කඩිනමින් පැති බැම්ම සකස් කළ යුතු බවත් එසේ නොකළහොත් මෙය සකස් කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා පැවසීය.

විවාද අවස්ථාව අවසන් බව දැන්වූ මූලාසනය විසින් අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

## 05.01.07. වොලිබොල් / බැට්මින්ටන් ක්‍රීඩා කිරීම සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් සතොස ආයතනය පවත්වාගෙන යන වාණිජ ගොඩනැඟිල්ල පසුපස සහ සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැඟිල්ලට දකුණු පසින් ඇති හිස් භූමියෙහි වොලිබෝල් / බැට්මින්ටන් ක්‍රීඩා කිරීම සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකර එය ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස යොදා ගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පළාත් පාලන සතිය වෙනුවෙන් මෙම ස්ථානයේ වොලිබෝල් ගැසීම සඳහා තාවකාලිකව සකස් කළ බව ගරු මූලාසනය විසින් වැඩිදුරටත් පැහැදිලි කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

මෙම ස්ථානය ගෘහස්ථ ක්‍රීඩාංගනයක් සෑදීමට වඩා සභාව සඳහා බඳු ආදායම් ලබා ගැනීමට හැකිවන පරිදි වාණිජමය වටිනාකමකින් යුතු කඩකාමර ඉදිකිරීමට සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා පැවසීය. එසේම සතොස සඳහා බඩු තොග රැගෙන එන වාහන ද මේ අසල නතර කරන බවත් ක්‍රීඩාංගනයේ ක්‍රීඩා කරන විට එම ස්ථානයේ නැවැත්වීමට නොහැකි බවත් සංස්කෘතික මධ්‍යස්ථානයේ උත්සව , වැඩසටහන් පැවැත්වෙන විට ඒ සඳහා සහභාගී වන අයගේ වාහනද නතර කිරීමට ස්ථානයක් ද නොමැති වනු ඇත. එසේම මෙම ක්‍රීඩාංගනයේ ඝෝෂාව නිසා හා වාහන නතර කිරීමට ස්ථානයක් නොමැති වීම නිසා සංස්කෘතික මධ්‍යස්ථානය කුලියට ගැනීම නතර වන බැවින් කුලී ආදායමද අඩුවන බව පැවසීය. බිබිල මහජන ක්‍රීඩාංගනයෙහි මෙම ක්‍රීඩා කටයුතු සිදුකළ හැකි බවත් පැවසීය. එසේම වෙල්ලස්ස ජාතික පාසලෙහි ක්‍රීඩාංගනය අක්කර 5ක පමණ ප්‍රමාණයක් ඇති බවත් නීත්‍යානුකූල අවසර ලබාගෙන එවැනි ස්ථානයක ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම සුදුසු බවත් මෙවැනි වාණිජමය වටිනාකමක් ඇති ස්ථානයක ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සුදුසු නොවන බවත් පැවසීය.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

මෙම යොජනාව ඉදිරි සභාවාරයට කල් කල්තැබීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව හා තීරණය ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.08.මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.</u>

2025.10.10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

01.දැනට මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයින් වශයෙන් කටයුතු කරන එම්.ජෝතිපාල මහතා හා ඒ.එම්.හේමරත්න මහතා එම කමිටුවට සහභාගී වීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් එම සාමාජිකයන් දෙදෙනා වෙනුවට මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නව සාමාජිකයන් වශයෙන් පහත නම් සඳහන් සාමාජිකයන් දෙදෙනා පත් කිරීම.

- එච්.එම්.පියදාස මයා - විශ්‍රාමික බැංකු ලිපිකරු
- ඩී.එම්.දස්කොන් මයා - විශ්‍රාමික ඩිපෝ නිලධාරි

02. බිබිල ප්‍රාදේශීය සභාවේ ඒ.එම්.එන්.එන්.ගුණසේකර මහත්මියගේ පරිගණක යන්ත්‍රය CPU යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බැවින් එය මිල ගණන් කැඳවා සකස් කර ගැනීම.

03. බිබිල ප්‍රාදේශීය සභාවේ පරිගණක අළුත්වැඩියා කිරීම සඳහා දැනට මෙම ප්‍රදේශයේ ඒ පිළිබඳව කටයුතු කරන එකම ආයතනය වන බිබිල රතුපස්කැටිය පාර, සමාධි ආයතනය සමඟ පරිගණක අළුත්වැඩියා කර ගැනීම සඳහා ගිවිසුම්ගත වීම.

04. 2026 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා 2025 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගත් කාණ්ඩවලට අමතරව පහත සඳහන් කාණ්ඩ එයට ඇතුලත් කිරීම.

- තණකොළ කපන යන්ත්‍ර වෙනසෝ මැෂින් හා අමතර කොටස්
- ජෙනරේටර් සේවා කිරීම හා අළුත්වැඩියා කිරීම
- හාඩ්වෙයාර් ද්‍රව්‍ය හා උපකරණ
- CCTV කැමරා සවිකිරීම ,අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම
- අනතුරුදායක ගස් ඉවත් කිරීම.

05. පෙරටු කාර්යාලයට අවශ්‍ය 2/4 2ply chp (ප්‍රින්ට් පේපර්) 05 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

06. විථී ලාම්පු ගබඩාවට අවශ්‍ය පහත උපාංග ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| | |
|---|---|
| 01.හෝල්ඩර් | 100 |
| 02.වන් ගැන් ස්විච් | 100 |
| 03.පහන් ආවරණ | 50 |
| 04.බන්ඩල් ක්ලිප් | 100 |
| 05.සන් පෙට්ටි | 100 |
| 06.1/13 වයර් | 05 |

07. බිබිල ප්‍රාදේශීය සභා ආදාහනාගාරය සඳහා අවශ්‍ය පහත උපකරණ ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම

| අ.අ. | උපකරණය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 01 | අඩි 08 සැටල් එක හෝ ඉනිමග | 01 |
| 02 | විල්බැරෝ | 01 |
| 03 | පොඩි සවල් | 01 |
| 04 | උදලු | 01 |
| 05 | ඩස් පෑන් | 01 |
| 06 | අඩි 100 රබර් හෝස් | 01 |
| 07 | ගිනි නිවන උපකරණ | 01 |
| 08 | ප්ලාස්ටික් පුටු | 25 |
| 09 | පිහියා | 01 |
| 10 | කැති | 01 |
| 11 | මල් බාල්දි | 01 |
| 12 | විදුලි පන්දම් | 01 |
| 13 | අත් ග්ලවුස් ජෝඩු | 04 |
| 14 | බූට් ජෝඩු | 02 |
| 15 | සබන් | - |

08. බිබිල ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ශ්‍රවණාගාරයේ විදුලි බුබුළු 50 ක් පමණ අක්‍රීය වී ඇති බැවින් ඒ සඳහා නව විදුලි බුබුළු ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

09. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් RX 8364 ජල බවුසරයේ මෝටරයේ දැනට භාවිතා කරන හෝස් බටය පළුදු වී ඇති බැවින් නව හෝස් බටයක් (අඩි 50) ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

10. PF 7391 කැබ් රථයේ දැනට භාවිතා කරන ටයර් ගෙවී ඇති බැවින් එම රථය සඳහා ටයර් 04 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

11. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් කාර්යාලයේ ජෙනරේටරයේ විදුලිය ආරෝපනය නොවීම නිසා 90W වර්ගයේ නව බැටරියක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

12. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ ලෝඩර් යන්ත්‍රයේ පිටුපස බැකෝ එකට සවිකරන දත් ගෙවී ගොස් ඇති බැවින් ඒ සඳහා නව දත් ප්‍රසම්පාදනය කර සවිකර අලුත්වැඩියා කිරීම.

13.මොණරාගල පාර ඉකිරියන්පොළ ලන්ද පටුමගෙහි අංක 12 දරණ උළු සෙවිලි ගරා වැටුනු දේපළ හිමිකරු වන ඩී.එම්.නන්දාවතී මහත්මිය විසින් 2024.12.31 දිනට වරිපනම් හිඟ මුදල රු.6,671.89 ක මුදල ගෙවීමට නොහැකි බව දන්වමින් හා අඩු ආදායම්ලාභී බව ග්‍රාම නිලධාරි සහතික කරමින් ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇති බැවින් එම හිඟ බදු මුදල නිදහස් කිරීම.

14. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පොදු ගබඩාවට හා සෞඛ්‍ය කම්කරුවන් සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය හා උපකරණ ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ. | ද්‍රව්‍ය හෝ උපකරණය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 01 | පෙන්ඩ්‍රයිව් (32 GB) | 05 |
| 02 | කැල්කියුලේටර් | 05 |
| 03 | ස්ටෙප්ලර් මැෂින් | 05 |
| 04 | බූට්ස් යුගල් | 10 |

15. 2025.10.29 දින පැවැත්වීමට නියමිත ඌව පළාතේ පළාත් පාලන නියෝජිතයින් වෙනුවෙන් සභා රැස්වීම් රීති සම්බන්ධ පුහුණු වැඩසටහන සඳහා සහභාගි වන බිබිල හා මැදගම පළාත් පාලන නියෝජිතයින් හා නිලධාරීන් වෙනුවෙන් උදෑසන තේ, දිවා ආහාරය හා ලිපිද්‍රව්‍ය වියදම් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූර්ණය කරන තෙක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම හා ඒ සඳහා රු.50,000.00 ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීම.

16. අදාහනාගාර පිවිසුම සකස් කිරීමට අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| අ.අ. | ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 01 | සිමෙන්ති | 30 Bag |
| 02 | වැලි | 4 Cub |
| 03 | ගල් කුඩු (Quarry Dust) | 12 Cub |
| 04 | රතු සිමෙන්ති කුඩු | 5 Kg |

| | | |
|---|---|---|
| 05 | මැටල් (3/4) 20 mm | 2 Cub |
| 06 | අඩි 08 දිග අගල් 9 විශ්කම්භය සහිත හියුම් පයිප්ප | 02 |
| 07 | අඩි 04 දිග අගල් 9 විශ්කම්භය සහිත හියුම් පයිප්ප | 02 |
| 08 | ගල් රෝල | දින 06 |
| 09 | අත් ගලවුස් | 40 |
| 10 | නූල් පන්දු | 05 |

17. නායකඳුර ජල පිල්ටරය සඳහා පහත සඳහන් පෙරහන් මාධ්‍ය ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

| No. | Filter Media | Quantity |
|---|---|---|
| 01 | 5-10  mm Filter Media | 1.50 $m^3$ |
| 02 | 10-20 mm Filter Media | 2.00 $m^3$ |
| 03 | 20-40 mm Filter Media | 2.50 $m^3$ |

18. ගලි බවුසරයේ පහත සඳහන් දෝෂ එම රථයේ නියෝජිත ආයතනය වන SOLEX ආයතනයෙන් සිදුකරගැනීම.

- අපද්‍රව්‍ය ඇතුල් කර ගැනීමේ හා පිටකිරීමේ කරාම තුලින් අපද්‍රව්‍ය කාන්දු වීම.
- හෝස් බටයේ තැනින් තැන සිදුරු වී අබලන් තත්වයට පත්වීම.
- ගලි බවුසරයේ පොම්පයේ ඔයිල් කාන්දු වීම.

19. ZA 5164  බැකෝ ලෝඩර් යන්ත්‍රයේ පිටුපස දකුණ ස්විමින්ග් ජැක් එකේ ඔයිල් කාන්දුවීම හා ජැක් එක සම්බන්ධිත පින් එක දෝෂ සහිත වීම දැනට යන්ත්‍රය ගලවා බලා අළුත්වැඩියා කටයුතු සිදු කරගෙන යන බිබිල, රදලියද්ද, නලින් වැල්ඩින් වර්ක්ස් ආයතනයෙන් පළාත් යාන්ත්‍රික නිර්දේශ ලබාගෙන අලුත්වැඩියාව සිදු කර ගැනීම.

20. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් සංස්කෘතික මධ්‍යස්ථානයේ පවතින 20 KVA ජෙනරේටරයේ වාර්ෂික සේවාව සඳහා එහි නියෝජිත ආයතනය වන  TRADE PROMOTERS (PVT) LTD ආයතනයට සේවා ගාස්තුව  රු.269,370.00 ක් ගෙවීම අධික පිරිවැයක් බැවින් එම සේවා ගාස්තු ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හා ඒ වෙනුවෙන් 2026 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමේදී ජෙනරේටර් සේවා කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර අළුත්වැඩියාවන් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරගැනීම.යන කටයුතු වෙනුවෙන් ගරු මහසභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් ගරු මූලාසනය විසින් විවාද අවස්ථාව ලබාදෙන ලදී.

මෙම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සාමාජිකයින් වන එම්.ජෝතිපාල මහතා හා ඒ.එම්. හේමරත්න මහතා සහභාගිවීම ප්‍රතික්ශේප කර ඇති බැවින් ඒ වෙනුවට එච්.එම්. පියදාස මහතා හා ඩී.එම්.දස්කොන් මහතා පත්කර ඇත. එසේ මෙම සාමාජිකයින් ඉවත් වූයේ කුමන හේතුවක් නිසාදැයි පැහැදිලි කරන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා ගරු මූලාසනයෙන් විමසා සිටින ලදී.

එම්.ජෝතිපාල මහතාගේ කාර්ය බහුලත්වය නිසා හා ඒ.එම්.හේමරත්න මහතා විශ්‍රාමික සුවයෙන් කල් ගෙවීමට අවශ්‍ය බැවින් මෙම මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා සාමාජිකත්වයෙන් ඉවත් වී ඇති බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.09. 2025 වර්ෂයේ දෘශ්‍යාබාධිත දිනය සැමරීම.

2025.10.15 දින ට යෙදෙන ජාත්‍යන්තර සුදු සැරයටි දිනයට සමගාමීව බිබිල ප්‍රාදේශීය සභාව හා ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය එක්ව පුස්තකාල ශ්‍රවණාගාරයේදී දෘශ්‍යාබාධිත දින සැමරුමක් සංවිධානය කර ඇත. එම දින සැමරුමේදී බිබිල ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සත්කාරයක් ලෙස ත්‍යාගයක් ලබාදීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 වන පරිච්ඡේදයේ උප 23 වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ද 2025 වර්ෂයේ බිබිල ප්‍රාදේශීය සභා අයවැය ලේඛනයේ වැය ශීර්ෂ 505-3 යටතේ ආබාධිත පුද්ගලයින්ගේ වැඩසටහනක් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන ද දෘෂ්‍යාබාධිත පුද්ගලයින් 30 දෙනෙකු සඳහා කුඩ 30 ක් ලබා දීමට එක් අයෙකු වෙනුවෙන් රු.1200.00 බැගින් රු.360000.00 ක මුදලක් වැය කර වැඩසටහන පැවැත්වීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

විවාද අවස්ථාව අවසන් බව දැන්වූ මූලාසනය විසින් අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.10. බිබිල බස් නැවතුම් පොල පහළ ගොඩනැගිල්ලේ බිම් මහලේ පවත්වා ගෙන යන සෞඛ්‍යාරක්ෂිත පොදු වැසිකිළි පද්ධතියෙහි කාන්තාවන්ගේ වැසිකිළිය සඳහා පිටත බිත්තියේ කොටසක් නිරාවරණය කර දොරක් සවි කිරීම.

බිබිල බස් නැවතුම් පොල පහළ ගොඩනැගිල්ලේ බිම් මහලේ පවත්වා ගෙන යන සෞඛ්‍යාරක්ෂිත පොදු වැසිකිළි පද්ධතිය ඉතාමත් අබලං තත්වයේ පැවති අතර, ප්‍රතිලාභීන්ගේ සහ ව්‍යාපාරික ප්‍රජාවේ ඉල්ලීම අනුව 2025 වර්ෂයේ සනීපාරක්ෂක පහසුකම් (වැසිකිළි අලුත්වැඩියාව) සංවර්ධනය කිරීම සඳහා ඌව

පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂකර්ම හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය මිලියන 1.6 ක මුදලක් අනුමත කර ඇත. මේ වන විට එහි 80% පමණ වැඩ අවසන් කර ඇත. තවද එම මුදල මෙම කාර්යය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඉතිරි වැඩ සඳහා රුපියල් මිලියන 0.38 ක මුදලක් වෙන් කර ඇත.

මෙම වැසිකිළි පද්ධතිය ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ අධීක්ෂණයට ලක්වූ අතර, පිරිමි වැසිකිළිය හරහා කාන්තාවන්ගේ වැසිකිළියට ප්‍රවේශ විය යුතුය. එහි දී කාන්තාවන්ගේ පෞද්ගලිකත්වයට හානි සිදු විය හැකි බැවින් කාන්තාවන්ගේ වැසිකිළිය සඳහා පිටත බිත්තියේ කොටසක් නිරාවරණය කර දොරක් සවි කල යුතු බව වැඩි දුරටත් ප්‍රකාශ කර ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් කිසියම් සැලැස්මකට අනුව ඉදි කර ඇති මෙම ගොඩනැගිල්ලේ යම් වෙනසක් සිදු කළ යුතු නම් ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ගේ අනුමැතිය ලබාගත යුතු ව ඇති බැවින් ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

එහිදී ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා පවසා සිටියේ ඩබ්.එම්.රූපසේන මැතිතුමා, පී.ජයන්ති මැතිතුමිය, ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය ඇතුළු ගරු මන්ත්‍රීන් හා මන්ත්‍රී තුමියන් කිහිපදෙනෙකු එක්ව මෙම වැසිකිළිය නිරීක්ෂණය කළ අතර මෙම වැසිකිළියෙහි පිරිමි වැසිකිළිය මඟින් ගැහැණු වැසිකිළියට පිවිසීමට ඇති බැවින් කාන්තාවන්ගේ වැසිකිළිය සඳහා පිටත බිත්තිය නිරාවරණය කර දොරක් සවි කිරීමට සුදුසු බව ඉතාම කාලෝචිත යෝජනාවක් බවත් සභාවේ කම්කරුවන් යොදවා පිරිසිදු කිරීම සුදුසු බවත් පැවසූ මන්ත්‍රීවරයා ලුණුගල නගරයේ ඇති පොදු වැසිකිළිය ඉතාමත් පිරිසිදු බවත් එවන් වැසිකිළියක් ලෙස මෙම වැසිකිළිය පවත්වාගෙන යාම සුදුසු බව ද පෙන්වා දෙන ලදි.

ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය අදහස් දක්වමින් තමාද මෙම නිරීක්ෂණය සඳහා සහභාගි වූ බවත් මෙම වැසිකිළියෙහි දොර වෙනස් කිරීම සුදුසු බව පැවසීය.

විවාද අවස්ථාව අවසන් බව දැන්වූ මූලාසනය විසින් අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11. බිබිල වැගම ප්‍රජාශාලාව පිහිටි බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් කොටසෙහි තාවකාලික භෝගයක් වගා කිරීම සඳහා ආර්.ඒ.එන්. නියතපාල මහතා කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වැගම ප්‍රජාශාලාව පිහිටි ඉඩම සණ කැලෑවකින් වැසී පැවති තිබූ බැවින් තාවකාලික භෝගයක් වගා කිරීම සඳහා එළි කල බවත් ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ අවසරය ලබා දෙන ලෙස ආර්.ඒ.එන් නියතපාල මහතා ඉල්ලුම් කර ඇත. එම මහතා හට මෙම කන්නයේ දී පමණක් තාවකාලික භෝගයක් වගා කිරීමටඅවසර ලබාදීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

වාසනා උයන ආර්.ජ්.එන්. නියතපාල මහතා බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක් එළිකර මාස තුනක කන්න භෝග වගාවක් සිදුකිරීමට සූදානම් කරන බව බිබිල ප්‍රාදේශීය සභාව දැනුවත් වූ නිසා 2025.10.13 දින බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිළධාරිතුමිය එහි ගොස් එම ඉඩම සුද්ධ කර ඇති බවත් භෝග වගා කිරීමට බිම් සකස් කර ඇති බවත් වාර්තා කිරීමෙන් පසු එම මහතා හට මෙම ඉඩමෙහි තාවකාලික කන්න භෝගයක් වගාකර ගැනීමට අවසරය ලබාදුන් අතර මෙම කන්නය පමණක් වගා කරන ලෙසද දැන්වූ බවද ගරු මූලාසනය විසින් පැහැදිලි කර මෙම මහතා මෙම ඉඩම සුද්ධ කර එළිකර ප්‍රජාශාලාව පිරිසිදුව පවත්වාගෙන යාම පිළිබඳව ස්තූති වන්ත වියයුතු බව ගරු මූලාසනය විසින් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

ඒහිදි ගරු එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් මෙම ඉඩමෙහි මෙම භෝගය මෙම කන්නයේ පමණක් වගා කරන බවට ලිපියක් ලබා ගන්නා ලෙස දන්වා සිටින ලදී.

මෙම ප්‍රජාශාලාව පිහිටා ඇති ඉඩම ආර්.එම්.එන්. නියතපාල මහතා තමාගේ පෞද්ගලික බූදලයක් ලෙස සලකා මෙම ස්ථානයේ කිහිප දෙනෙක් එක්ව ප්‍රයෝජන ලබාගන්නා බව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය පවසා සිටියේ මෙම ගොඩනැගිල්ලේ යතුරද ඔහු සතුව තබාගෙන සිටින බවයි. මෙම ඉඩම කැලෑවට තිබූ බව ඇත්තක් වූවද සභාවේ අවසරයක් නොමැතිව එළිකලේ නම් ඒ සඳහා වැයවූ මුදල ඔහු දරා ගතයුතු බවත් එය එම මහතා හට වගා කිරීමට නොදෙන ලෙස පැවසූ අතර එම ප්‍රජා ශාලාව සේවා පියස ලෙස නම් කර ආර්ථික සංවර්ධන නිළධාරි සඳහා කාර්යාලයට ලබාදීම සුදුසු බවත් එම ඉඩම වටා මායිම් සොයා වෙන් කිරීම සුදුසු බව පවසන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දන්වා සිටින ලදී.

ආර්.එම්.එන්. නියතපාල මහතාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර එම වගාකිරීම අත්හිටුවා ඉඩමේ මායිම් හඳුනාගෙන වෙන් කර ගෙන මෙම ප්‍රජාශාලාවෙහි යතුර බිබිල ප්‍රාදේශීය සභාවට භාරගෙන ඒ සඳහා නිළධාරියෙකු යෙදවීමට තීරණය කරන ලදී.

ගරු මූලාසනය විසින් අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා</u>

## <u>05.02.01. මඩුලන්ද ළහිරු පෙර පාසලේ සෙල්ලම් මිදූල සකස් කිරීම සඳහා සෙල්ලම් උපකරණ ඉල්ලුම් කිරීම සම්බන්ධවයි.</u>

මඩුලන්ද ළහිරු පෙර පාසලේ සෙල්ලම් මිදූලෙහි සෙල්ලම් උපකරණ කිසිවක් නොමැති බැවින් පෙර පාසලට දරුවන් ඇතුළත් කිරීමද අඩුවී ඇති බැවින් පෙර පාසල සඳහා සෙල්ලම් උපකරණ ලබා දෙන ලෙස පෙර පාසල් ගුරුතුමිය ඉල්ලුම් කර ඇත. එම පෙර පාසලට සෙල්ලම් උපකරණ ලබාදීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

දරුවෙකු මුල් ළමාවිය සංවර්ධනය කරනු ලබන පෙර පාසල් වල ළමයින්ගේ ක්‍රියාකාරකම් වර්ධනය කරනු ලබන සෙල්ලම් උපකරණ නොමැති පෙර පාසල් බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හයක් පමණ පවතී. ළමා උද්‍යානය මහින් ගලවා ඇති සෙල්ලම් උපකරණ සුළු වියදමකින් අලුත්වැඩියා කළහැකි බවත් එම උපකරණ ,සෙල්ලම් උපකරණ නොමැති පෙර පාසල් හඳුනාගෙන උපකරණ දෙක බැගින් හෝ ලබාදීම සුදුසු බව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා පැවසීය.

ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා පවසා සිටියේ තමන් මෝටර් ග්‍රේඩර් කර මාර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය කරන ලෙස හා වීථි ලාම්පු යොදන ලෙස යෝජනා කළද සභාවේ මූල්‍යමය ප්‍රතිපාදන නොමැති බැවින් ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සිදු නොකර ඇති බැවින් මෙවන් අත්‍යාවශ්‍ය කාරණා කිරීමට තිබියදී සෙල්ලම් උපකරණ අලුත්වැඩියා කිරීමට මුදල් වැය කිරීම පිළිබඳව තමා විරෝධතාවය පල කරන බවත් මල්ලැහැව පාසල ඉදිරිපිට වීථි ලාම්පුව අක්‍රීය වී ඇති බවත් කඩිනමින් මෙය යෙදීමට කටයුතු කරන ලෙසත් ඉල්ලීමක්ද කරන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව මහින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල් දෙකක් පවතින අතර ප්‍රාදේශීය සභාව මහින් නියාමනය කරනු ලබන පෙර පාසල් රාශියක්ද පවතී. ගමක පොදු ස්ථානයක පවත්වාගෙන යනු ලබන (පන්සලක,ප්‍රජා ශාලාවක) පෙර පාසලකට මෙම සෙල්ලම් උපකරණ ලබාදීමට සුදුසු බවත් ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් පවසා සිටින ලදී.

ළමා උද්‍යානයේ සවිකර තිබූ මෙම සෙල්ලම් උපකරණ වැල්ඩින් කිරීම සඳහා වැල්ඩින් ප්ලාන්ට් එකක් මිලදී ගෙන සභාවේ වැල්ඩින් කිරීම සම්බන්ධ දැනුමක් ඇති සේවකයකු යොදවා වැල්ඩින් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා පවසා සිටින ලදී.

මෙම මඩුලන්ද පෙර පාසල ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මියගේ බල ප්‍රදේශයේ පවත්වාගෙන යන පෙර පාසලක් බවත් බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මුල් ළමාවිය සංවර්ධනය කිරීම සඳහා පවත්වාගෙන යන පෙර පාසල් කිහිපයකම දරුවන් අඩු බවත් එසේ අඩුවීමට හේතුව ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල් ආරම්භවීම බවත් පැවසූ අතර මෙම පෙර පාසල් සඳහා ළමා උද්‍යානයේ සවිකර තිබූ එම සෙල්ලම් උපකරණ අලුත්වැඩියා කර සෙල්ලම් උපකරණ නොමැති ළමුන් 10කට වඩා වැඩිව සිටින පෙර පාසල් හඳුනාගෙන ඒවා සඳහා සෙල්ලම් උපකරණ දෙක බැගින් හෝ ලබාදීමට සුදුසු බව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය පවසා සිටින ලදී.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දන්වා සිටින ලදී.

බිබිල ළමා උද්‍යානයේ ගලවා ඉවත් කළ සෙල්ලම් උපකරණ කඩිනමින් අලුත්වැඩියා කර බිබිල ප්‍රාදේශීය සභාව මහින් පාලනය වන පෙර පාසල් දෙකට ලබාදී ඉතිරි වන සෙල්ලම් උපකරණ බිබිල බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සෙල්ලම් උපකරණ නොමැති පෙර පාසල් හඳුනා ගෙන එම පෙර පාසල් වලට බෙදාදීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන බෙදා දීමට තීරණය කරන ලදී.

ගරු මූලාසනය විසින් අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

2025 ඔක්තෝබර් මස 10 වන දින පැවැත් වූ මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ වාර්තාව ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලීම.

2025 සැප්තැම්බර් මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 9,938,642.11 |
| මූලධන ලැබීම් | - රු. - |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබිම් | - රු. 590,121.23 |
| මුළු ලැබීම් | - රු.10,528,763.34 |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 8,864,238.58 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 41,161.54 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 1,906,112.74 |
| ආයෝජන | _රු. - |
| මුළු වියදම් | - රු 10,811,512.86 |

**2025.08.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 17,415,868.59 |
| අක්කර බදු | - රු. 6,419.14 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 2,126,641.90 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 709,662.00 |
| කුලී මුදල් | - රු. 1,756,173.67 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 2,979,871.37 |
| එකතුව | - රු 24,994,636.67 |

## 08.වෙනත් කරුණු

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා අදහස් දැක්වීම.**

බිබිල සංස්කෘතික මධ්‍යස්ථානය දැනට රිදීමාලියද්දෙහි ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන බවත් එහි සේවය කරන නිළධාරීන් සඳහා රජයෙන් වැටුප් ගෙවන බවත් බිබිලේ ජනතාවට මෙමගින් සේවාවක ඉටු නොවන බැවින් බිබිල සංස්කෘතික මධ්‍යස්ථානය රිදීමාලියද්දේ සිට බිබිලේ ගොඩනැඟිල්ලක ස්ථාපිත කර බිබිලේ ජනතාවට සේවාවක් ඉටු කිරීම සුදුසු බව පැවසීය.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.**

2024 අගෝස්තු මාසයේ රු.68,000.00 ක මුදලක් මන්ත්‍රී දීමනා ගෙවූ බවට හා එතැන් සිට දෙසැම්බර් මාසය දක්වා මන්ත්‍රී දීමනා ගෙවූ බවට සටහන් වී ඇති බවත් එම කාලය තුළ මන්ත්‍රීවරුන් පත්වී නොසිටි බැවින් ඒ පිළිබඳව විස්තරයක් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

2024 වර්ෂයේ අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා මන්ත්‍රී දීමනා ගෙවීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එම අවස්ථාවේදී එම මන්ත්‍රී දීමනා ගෙවීම් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බිබිල කොටගම බලාගාර මාර්ගයේ ටොන් 60ක් බරැති වාහන ගමන් කිරීම තහනම් කිරීමේ නාම පුවරුවක් සකස් කර එම ස්ථානයෙහි සවි කරන ලෙස ඉල්ලීමක් සිදුකළ බැවින් එම පුවරුව සකස් කර ඇති බවත් එය එම ස්ථානයෙහි සවි කරන ලෙස තමා හට බිබිල ප්‍රාදේශීය සභාවෙන් දැන් වූ බවත් එය බිබිල ප්‍රාදේශීය සභාව මගින් සවි කළ යුතු දෙයක් මිස තමා පෞද්ගලිකව සවි කළ යුත්තක් නොවන බව පෙන්වා දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව සඳහා ආදායම් උත්පාදනය කළ හැකි ස්ථාන දෙකක් වන බිබිල සතිපොල උඩු මහල හා සතොස ගොඩනැඟිල්ලෙහි උඩුමහල සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර තිබේද? එසේ නැතිනම් ඒ සඳහා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කළයුතු දැයි ගරු ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ගරු මූලාසනයෙන් ප්‍රශ්න කරන ලදී.

මේ වනවිට සතොස ගොඩනැඟිල්ලේ උඩු මහල සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර ඇති බවත් සතිපොල ගොඩනැඟිල්ල සඳහා මේ වන තෙක් ව්‍යාපෘති වාර්තා සකස් කර නොමැති බවත් ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා හට ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී.

සතිපොළ ගොඩනැගිල්ලේ උඩු මහලෙහි වෛද්‍යවරුන් සඳහා නේවාසිකාගාර ඉදිකිරීම සංචාරකයින්ට නවාතැන්පොලක් හෝ රෙස්ටුරන්ට් එකක් බාර් එකක් ආදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වුවද ඊට පෙර මෙහි වහලය සකස් කළයුතු බවත් ඒ සඳහා සභාව සතුව ප්‍රතිපාදන නොමැති බවත් පැවසූ ගරු මූලාසනය පුද්ගලික ව්‍යවසායකයින් ඉදිරිපත්ව මෙම උඩුමහල ඉදිකර ආයෝජනය කරන්නේ නම් ඒ සඳහා ලබාදීමටද හැකි බවත් පැවසීය.

**ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය අදහස් දැක්වීම.**

බිබිල ආයුරුවේද මධ්‍යස්ථානය ඉදිකිරීම පිළිබඳව ගරු පී.ජයන්ති මැතිතුමිය විසින් ගරු මූලාසනයෙන් විමසන ලදී.

බිබිල පැරණි ආයුර්වේද ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට යෝජනා කර ඇති බවත් බිබිල සම්පත් මධ්‍යස්ථානය වර්ල්ඩ් විෂන් ලංකා ආයතනයෙන් ලබාගත් පසු එම ගොඩනැගිල්ලෙහි කොටසක ආයුර්වේදය පිහිටුවීමටත් එමඟින් ආදායම් උත්පාදනය කර ගැනීමට අවශ්‍ය බැවින් සම්භාහන කටයුතු ද සිදු කිරීමට හැකි නම් ඉතා සුදුසු බවත් ගරු මූලාසනය විසින් පවසන ලදී.

## ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා අදහස් දැක්වීම.

රිදීමාලියද්දේ පවත්වාගෙන යනු ලබන බිබිල සංස්කෘතික මධ්‍යස්ථානය බිබිල සම්පත් මධ්‍යස්ථානයෙහි ස්ථාපිත කිරීමට සුදුසු බවත් පැවසීය. තැටි සිල්වා මහතා විසින් ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා බදුල්ලගම්මන පාරෙන් ඉඩම් කොටසක් පරිත්‍යාග කර ඇති බවත් එම ඉඩමෙහි කණු ටිකකින් හෝ කාමර ඉදිකර ගරාජ් සඳහා හෝ කුලියට ලබාදී ආදායම් උත්පාදනය කරගත හැකි බවත් පැවසීය.

වොලිබෝල් හෝ බැට්මින්ටන් ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීමට යෝජනා කළ සංස්කෘතික මධ්‍යස්ථානය අසළ භූමි ප්‍රමාණය වාණිජමය වටිනාකමකින් යුතු තැනක මෙන්ම සංස්කෘතික මධ්‍යස්ථානයේ වැඩසටහන් පවත්වන විට වාහන නතර කිරීම සඳහාද ඇති එකම ඉඩ ප්‍රමාණය බැවින් මෙම ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉසුරු උයනෙහි හෝ දනුෂ හෝටලය පිටුපස ඇති ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම්වල ඉදිකිරීම සුදුසු බව පැවසීය.

නිල්ගල කොට්ඨාසයේ මාර්ග අබලන් වී ඇති බවත් එම මාර්ග මෝටර් ග්‍රේඩර් කර පිළිසකර කිරීමට සුදුසු බවත් අක්‍රීය වී ඇති වීථි ලාම්පු යෙදීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

## ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා අදහස් දැක්වීම.

මේ වනවිට තැටි සිල්වා මහතා පරිත්‍යාග කළ බදුල්ලගම්මන මාර්ගය පිහිටා ඇති ඉඩම සභාව සතුදැයි සොයා බලමින් සිටින බවත් රිදීමාලියද්දේ පිහිටා ඇති බිබිල සංස්කෘතික මධ්‍යස්ථානය සම්පත් මධ්‍යස්ථානයෙහි පිහිටුවහොත් මෙම ගොඩනැගිල්ල සංස්කෘතික අමාත්‍යාංශය සතුවන බැවින් බිබිල ප්‍රාදේශීය සභාවට ඉදිරියේදී ලැබීමට ඇති ආදායමක් අහිමි කෙරෙන බව පැවසූ මන්ත්‍රීවරයා බිබිල සංස්කෘතික මධ්‍යස්ථානය බිබිලට රැගෙන ඒමට සාකච්ඡා කළයුතු බව පැවසීය.

## ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය අදහස් දැක්වීම.

හේන්යාය මාර්ගය මේ වනවිට ඉදිකර අවසන් වුවද මේ වන තෙක් විවෘත කර නොමැත. එම මාර්ගය විවෘත කිරීම පිළිබඳව ගරු මූලාසනයෙන් විමසා සිටින ලදී.

එම මාර්ගය ඉදිකර දින 14ක් අවසන් වූ විගසම මාර්ගය ජනතාව සඳහා විවෘත කරන බව ගරු මූලාසනය විසින් පැවසීය.

## ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දැක්වීම.

ගෘහස්ථ ක්‍රීඩාංගනය සංස්කෘතික මධ්‍යස්ථානය අවසානයේ ඉදිකිරීම නුසුදුසු බවත් මෙම මහජන ක්‍රීඩාංගනයේ ඉදිකිරීම සුදුසු බවත් මෙම ඉදිකිරීම් සිදු කිරීමේදී අවබෝධයෙන් යුතුව ඉදිකළ යුතු බවත් පැවසීය. යශෝධරා බාලිකා විද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉරු නැගෙන බසින දිශාවට මුහුණලා

සෙල්ලම් කරන ආකාරයට ඉදිකර ඇති බවද පැවසීය. සංස්කෘතික මධ්‍යස්ථානයේ ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකළහොත් සංස්කෘතික මධ්‍යස්ථානයේ වැඩසටහන් පවත්වන විට වාහන නැවැත්වීමට ස්ථානයක් වත් නොමැති වන බැවින් දැනට උත්පාදනය කරනු ලබන ආදායමවත් නොලැබී යන බව පැවසීය. එම ස්ථානයේ හෙළ බොජුන්හල ඉදි කිරීමද වැරදි බව පැවසීය.

එසේම සභාවට ලබා ගැනීමට තිබූ වාණිජ වටිනාකමකින් යුතු ඉඩම් හබ්බුන්නා කඳුර අසල තිබූ බවත් එම ඉඩම්වල කිසිම ප්‍රයෝජනයක් නොමැති ඉදිකිරීම් සිදුකර ඇති බවද පෙන්වා දෙන ලදී.

## ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා අදහස් දැක්වීම.

මෙම සංස්කෘතික මධ්‍යස්ථානය අසල ගෘහස්ථ ක්‍රීඩාංගනය ඉදිකිරීම නුසුදුසු බවත් එම ස්ථානයේ වාණිජ ගොඩනැගිල්ලක් ඉදි කිරීමෙන් ක්‍රීඩාංගනයට වඩා ආදායමක් සභාවට ලබා ගැනීමට හැකි බවත් මෙහි ඉදිකිරීම සඳහා බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක් බිබිල ප්‍රාදේශීය සභාවට ලබාගෙන ඉදිකිරීමට සුදුසු බවත් එසේ නොමැති නම් ඉසුරු උයන ඉඩමෙහි ඉදිකිරීම සුදුසු බවත් පැවසීය.

2025 ඔක්තෝබර් මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කල ගරු මූලාසනය විසින් 2025 නොවැම්බර් මසට අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකඟතාවය මත නොවැම්බර් 14 දින පෙ.ව.9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව ඔක්තෝබර් මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි

05.01.04 යෝජනාවෙහි යෝජනාව හා තීරණය ඒකමතිකව සභා සම්මත වූ බව දක්වා ඇති නමුත් එම යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ කිහිප දෙනෙක් විරෝධතාවය පලකල බැවින් එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ඒකමතිකව සභා සම්මත වීම ලෙස නොව කල්තැබූ යෝජනාවක් ලෙස සංශෝධනය වියයුතු බව හා ගරු ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් වෙනත් කරුණු යටතේ අදහස් දැක්වීමේදී ''තැටි සිල්වා මහතා පරිත්‍යාග කළ ඉඩම'' ලෙස දක්වා තිබීම **වැට් සිල්වා මහතා** ලෙස සංශෝධනය විය යුතු බවයි.